# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2024/6 - 2017 ජුනි මස 19 වැනි සඳුදා - 2017.06.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 4/81 (VI)

**1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත**

24ඇ සහ 24ඈ වගන්ති යටතේ වූ නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (2) වන ඡේදය සමග කියවිය යුතු 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 24ඇ සහ 24ඈ වගන්ති මඟින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මා විසින් මේ නියමය මඟින් -

(අ) මෙහි 1 වන උපලේඛනයේ විස්තර කර ඇති සීමා තුළ පිහිටි භූමි ප්‍රදේශය ඉහත කී පනතේ කාර්ය සඳහා පාරිසරික ආරක්ෂක ප්‍රදේශයක් විය යුතු බවටත්, එම ප්‍රදේශය "වරාතැන්න-හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බවටත් ;

(ආ) මෙම නියමය බලාත්මකව පවතිනතාක් කල් -

(i) ඉහත කී වරාතැන්න-හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය තුළ වූ ද, ඉහත කී පනතේ විධිවිධානවලට පටහැනි වූ ද, යම් සැළසුම් යෝජනා ක්‍රමයක් හෝ ව්‍යාපෘතියක් මේ නියමය නිකුත් කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක වීම නතර විය යුතු බවටත් ;

(ii) ඉහත කී වරාතැන්න-හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශයේ සීමා ඇතුළත බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ සිදුකිරීම අධිකාරිය හෝ අධිකාරිය විසින් බලය පවරන යම් තැනැත්තකු හැර වෙනත් කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු බවටත් ; සහ

(iii) වරාතැන්න-හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය තුළ යම් කටයුත්තක් පවත්වාගෙන යෑමට අදහස් කර සිටින යම් තැනැත්තකු විසින් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අවසරලත් භාවිතයන් පමණක් පවත්වාගෙන යා යුතු අතර මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති නියමයන් ප්‍රකාරව ඒ සඳහා අධිකාරියේ අනුමතය ලබා ගත යුතු බවටත් ;

ප්‍රකාශයට පත් කරමි.

(ඇ) අධිකාරිය විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශවලට අනුකූලව වරාතැන්න-හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය තුළ සිදුවන ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සඳහා පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත අධීක්ෂණ කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු ය :-

(i) කමිටුවේ සභාපතිවරයා වශයෙන් ක්‍රියා කළ යුතු අධ්‍යක්ෂවරයකුගේ තත්ත්වයට අඩු නොවන තනතුරක් දරන අධිකාරියේ නියෝජිතයෙකු ;

(ii) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නියෝජිතයෙකු ;

(iii) මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නියෝජිතයෙකු ;

(iv) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නියෝජිතයෙකු ;

(v) නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජිතයෙකු ;

(vi) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු ;

(vii) ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු ;

(viii) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයේ නියෝජිතයෙකු ;

(ix) මහනුවර මහනගර සභාවේ නියෝජිතයෙකු ;

(x) හාරිස්පත්තුව සහ යටිනුවර යන ප්‍රාදේශීය සභාවලින් එක් නියෝජිතයෙකු බැගින් ;

(xi) මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ, හාරිස්පත්තුව සහ යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් එක් නියෝජිතයෙකු බැගින් ;

(xii) ප්‍රදේශයේ ක්‍රියාත්මකව පවතින ප්‍රජා මූල සංවිධානයකින් එක් නියෝජිතයෙකු.

මේ නියමයේ කාර්ය සඳහා "අධිකාරිය" යන්නෙන් 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ පිහිටුවනු ලැබූ මධ්‍යම පරිසර අධිකාරිය අදහස් වේ.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2017 ක් වූ ජුනි මස 13 දින,
කොළඹ දී ය.

## I වන උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත් සතර සහ ගඟවටකෝරළේ, හාරිස්පත්තුව සහ යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පිහිටියා වූ මහවැලි ගඟ සහ එහි පිහිටි සියලුම දූපත් ඇතුළත්ව, ප්‍රමාණයෙන් හෙක්ටයාර 59.4 ක් වන්නා වූ පහත සඳහන් මායිම්වලින් වට වූ පහත සිතියමෙහි දැක්වෙන ප්‍රදේශය වරාතැන්න-හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය ලෙස හැඳින්වේ. එනම්,


*උතුරට* : පේරාදෙණිය-හල්ඔලුව-කටුගස්තොට මාර්ගයේ මධ්‍ය රේඛාව සහ දෙඩම්වල සංගිලි පාලමේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යයේ සිට දෙඩම්වල සංගිලි පාලමේ මධ්‍ය රේඛාව ඔස්සේ, එකී මධ්‍ය රේඛාව සහ ශ්‍රීමත් කුඩා රත්වත්තේ මාවතේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා,

*නැගෙනහිරට* : ඉහත අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට ශ්‍රීමත් කුඩා රත්වත්තේ මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ, දෙවැනි රාජසිංහ මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ හා කොළඹ-මහනුවර මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ගැටඹේ වටරවුමේ මධ්‍ය ලක්ෂ්‍යය දක්වා,

*දකුණට* : ඉහත අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට ගැටඹේ පාලමේ මධ්‍ය රේඛාව සහ කොළඹ-මහනුවර මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ, එකී මධ්‍ය රේඛාව, ගන්නෝරුව කෘෂිකර්ම මධ්‍යස්ථාන හන්දියේ දී පේරාදෙණිය-හල්ඔලුව-කටුගස්තොට මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා,

*බටහිරට* : ඉහත අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට පේරාදෙණිය-හල්ඔලුව-කටුගස්තොට මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ එකී මධ්‍ය රේඛාව, දෙඩම්වල සංගිලි පාලමේ මධ්‍ය රේඛාව හමුවන ස්ථානය දක්වා

වූ මායිම් තුළ පිහිටි ප්‍රදේශය වේ.




වරාතැන්න-හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශයේ (පා. ආ. ප්‍ර.) සිතියම

## II වැනි උපලේඛනය

### අවසරලත් භාවිතයන්

වරාතැන්න-හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය තුළ අවසරලත් භාවිතයන් පහත දැක්වේ :-

1. නාගරික සංවර්ධන අධිකාරිය සහ අදාළ පළාත් පාලන ආයතන විසින් අනුමත කරනු ලබන පදිංචිය සඳහා වන නිවාස, කාර්යාල, කුඩා පරිමාණ ව්‍යාපාරික ස්ථාන ඉදිකිරීම්.

2. දැනට පවත්නා පදිංචිය සඳහා වන නිවාස සහ නිවාස සංකීර්ණවල පුළුල් කිරීම්, යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම් හා නවීකරණය කිරීම්.

3. දැනට පවත්නා කාර්යාල සහ ව්‍යාපාරික ස්ථානවල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම් හා නවීකරණය කිරීම්.

4. දැනට පවත්නා මං මාවත්, ජල සැපයුම් සහ විදුලි සැපයුම් මාර්ග නඩත්තුව සහ අලුත්වැඩියා කිරීම්.

5. ආගමික, අධ්‍යාපනික හා පර්යේෂණ කටයුතු පවත්වාගෙන යාම.

6. අධ්‍යාපනික සහ පර්යේෂණ කටයුතු සඳහා පමණක් තාවකාලික කඳවුරු භූමි ඉදිකිරීම්.

7. දේශීය ශාක විශේෂ පමණක් භාවිතා කරමින් වන වගාවන් කිරීම සහ පැල තවාන් හා ඔසු උයන් ඇති කිරීම සහ පවත්වාගෙන යාම.

## III වන උපලේඛනය

### අවසරලත් භාවිතයන් ක්‍රියාත්මක කිරීමේ දී යටත් විය යුතු කොන්දේසි

වරාතැන්න-හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය තුළ සිදු කරනු ලබන අවසරලත් භාවිතයන්ට අදාළ සියලුම කටයුතු පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව සිදු කළ යුතු වේ.

1. II වැනි උපලේඛනයෙහි සඳහන් වරාතැන්න-හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය තුළ අවසරලත් භාවිතයන් සඳහා අනුමතය ලබා ගැනීමට අදාළ සියලුම අයදුම්පත් අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු ය.

2. II වන උපලේඛනයෙහි සඳහන් අනුමතය අපේක්ෂිත කිසියම් අවසරලත් භාවිතයක්, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ IV ඇ කොටස යටතේ නියම කරන ලද නියමිත ව්‍යාපෘතියක් වන අවස්ථාවක දී, අදාළ අධිකාරියෙන් එම නියමිත ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය පූර්ව අනුමතය ලබා ගත යුතු ය.

3. II වන උපලේනයෙහි සඳහන් කිසියම් අවසරලත් භාවිතයක්, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ IVඇ කොටස යටතේ නියම කරන ලද නියමිත ව්‍යාපෘතියක් නොවන අවස්ථාවක දී,

    (අ) ව්‍යාපෘති යෝජනාවක් අධිකාරිය විසින් සපයනු ලබන නිර්ණේය විෂයයන්ට හෝ ප්‍රශ්නාවලියකට අනුකූලව අනුමතය සඳහා අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

    (ආ) අධිකාරිය විසින් පත් කරනු ලබන තාක්ෂණික ඇගයීම් කමිටුවක් විසින් එම ව්‍යාපෘති යෝජනාව ඇගයීමට ලක් කර අධිකාරිය විසින් ;

        (i) කොන්දේසිවලට යටත්ව යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමතය ලබා දීම හෝ

        (ii) හේතු දක්වා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමතය ලබා දීම ප්‍රතික්ෂේප කිරීම,

    සිදු කළ යුතු ය.

    (ඇ) අධිකාරිය විසින් නිකුත් කරනු ලබන පාරිසරික අනුමැතිය ලබා දෙන ලද දින සිට වසර තුනක කාලයක් සඳහා වලංගු වේ.

(ඇ) පාරිසරික අනුමැතියේ වලංගු කාලය අවසන් වන දින සිට වැඩ කරන දින තිහකට (30) පෙරාතුව අයදුම්කරු විසින් අනුමතය අලුත් කිරීම සඳහා අයදුම් කළ යුතු ය.

4. වරාතැන්න-හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය තුළ පවත්නා ;

(අ) දූපත් තුළ හෝ

(ආ) රජයේ යම් ඉඩමක් තුළ

තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් හෝ කිසිදු ආකාරයක සංවර්ධන කටයුත්තක් හෝ සිදු නොකළ යුතු ය.

5. පාරම්පරික ඉඩම් ඥාතීන් අතර බෙදදීම සඳහා සිදු කෙරෙන ඉඩම් කට්ටි කිරීම හැර වරාතැන්න-හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය තුළ නිවාස ඉදිකිරීම් සඳහා හෝ වෙනත් සංවර්ධන කටයුතු සඳහා වාණිජ මට්ටමේ ඉඩම් කට්ටි කිරීම් සිදු නොකළ යුතු ය.

6. වරාතැන්න-හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශයේ තිරසාර පැවැත්මට අවහිරවන කිසිදු බාධාවක් හෝ ක්‍රියාකාරකමක් සඳහා අවසර දෙනු නොලැබිය යුතු ය. එවැනි යම් ඉදිකරන ලද බාධකයක් ඉවත් කිරීම සඳහා හෝ පවත්වාගෙන යනු ලබන ක්‍රියාකාරකමක් නැවැත්වීම සඳහා අධිකාරිය විසින් විධාන කරනු ලැබිය යුතු ය.

7. අවසරලත් භාවිතයන්ට අදළ සියලු සංවර්ධන ක්‍රියාකාරකම් අධිකාරිය විසින් ලබා දෙන මාර්ගෝපදේශවලට අනුව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

8. සියලු අවසරලත් භාවිතයන් පරිසරයට හානියක් හෝ අවහිරයක් නොවන පරිදි හෝ මහජනතාවට පීඩාවක් නොවන පරිදි පවත්වාගෙන යා යුතු ය.

9. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විමසා ගං ඉවුරේ සිට ගොඩබිම දෙසට මීටර් පහක (5m) රක්ෂිත ප්‍රදේශයක් සලකුණු කළ යුතු ය.

10. ඉහත 9 වන කොන්දේසියෙහි සඳහන් මීටර් 5ක ගඟ රක්ෂිත ප්‍රදේශය තුළ,

(අ) කිසිදු තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් සිදු නොකළ යුතු ය ;

(ආ) අධිකාරියේ හෝ වෙනත් අදළ ආයතනවල අනුමතය ලබා ගැනීමෙන් තොරව, පවත්නා ගොඩනැගිලි නවීකරණය කිරීම සිදු නොකළ යුතු ය ;

(ඇ) පවත්නා කිසිදු දේශීය සත්ත්ව හෝ වෘක්ෂලතා විශේෂයන්ට හානියක් සිදු කිරීම හෝ හානි සිදු විය හැකි කිසිදු කටයුත්තක් සිදු නොකළ යුතු ය ;

(ඈ) කිසිදු භූ අලංකරණ කටයුත්තක් සිදු නොකළ යුතු ය ;

(ඉ) කිසිදු ඉඩම් ගොඩකිරීමේ කටයුත්තක් සිදු නොකළ යුතු ය.

11. අධ්‍යාපන හා පර්යේෂණ කටයුතු සිදු කිරීමේ දී, කිසිදු රසායනික හෝ වෙනත් භෞතික ද්‍රව්‍යයක් පරිසරයට එකතු කිරීමක් හෝ පවත්නා පරිසර තත්ත්වයන් වෙනස් කිරීමක් සිදු නොකළ යුතු ය.

12. ආක්‍රමණශීලී ලක්ෂණ දරන හෝ ආක්‍රමණශීලී විය හැකියැයි අනුමාන කළ හැකි කිසිදු ආගන්තුක ශාක හෝ සත්ත්ව විශේෂයක් පාරිසරික ආරක්ෂක ප්‍රදේශය තුළ වගා කිරීම හෝ ඇති කිරීම හෝ පාරිසරික ආරක්ෂක ප්‍රදේශයට හඳුන්වා දීම සිදු නොකළ යුතු ය.

13. පාරිසරික ආරක්ෂක ප්‍රදේශය තුළ සිදු කරන කිසිදු ඉදිකිරීමක් ප්‍රදේශයේ ස්වභාවික සෞන්දර්යය හා දර්ශනය අවහිර වන පරිදි හෝ ඊට බාධාවක් වන පරිදි සිදු නොකළ යුතු ය.

14. කුඹුරු, වගුරු, ගොහොරු, මුඩු හෝ පහත් බිම් ගොඩ කිරීම සිදු නොකළ යුතු ය.

15. අපජලය සහ ඝන අපද්‍රව්‍ය, ඉහත සඳහන් සීමාව තුළ මහවැලි ගඟට හෝ ගඟ රක්ෂිතයට හෝ ගඟට සම්බන්ධවන ජල මාර්ගයකට හෝ ගොඩබිමට බැහැර කිරීම සිදු නොකළ යුතු ය.

16. මහවැලි ගඟෙහි භෞතික හෝ රසායනික තත්ත්වය වෙනස් කළ හැකි හෝ එහි ජීවත්වන සතුන්ට හෝ ශාකවලට අහිතකර විය හැකි කිසිදු රසායනික ද්‍රව්‍යයක් ඉහත කී සීමාව තුළ මහවැලි ගඟට හෝ ගඟ රක්ෂිතයට හෝ ගඟට සම්බන්ධවන ජල මාර්ගයකට හෝ බැහැර කිරීම සිදු නොකළ යුතු ය.

17. පාරිසරික ආරක්ෂක ප්‍රදේශය තුළ කිසිදු යාන්ත්‍රික හෝ ශිල්පීය ක්‍රමයක් භාවිතයෙන් ඛනිජ ද්‍රව්‍ය උකහා ගැනීම හෝ ගවේෂණ කටයුතු සිදු කිරීම නොකළ යුතු ය.

18. පවත්නා හෝ යෝජිත සියලු අවසරලත් භාවිතයන් සඳහා ;

(අ) පාංශු සංරක්ෂණය, වර්ෂා ජලය බැහැර කිරීම, අපද්‍රව්‍ය (ඝන හෝ ද්‍රව) කළමනාකරණය, අප ජලය කළමනාකරණය සහ භූ අලංකරණ කටයුතු සඳහා වන ඒකාබද්ධ කළමනාකරණ සැලැස්මක් පැවතිය යුතු ය.

(ආ) එවැනි සැලසුමක් සකස් කිරීමේ දී අධිකාරිය, පළාත් පාලන ආයතන හෝ අදාළ ආයතන විසින් නිකුත් කළ මාර්ගෝපදේශවලට අනුකූලව සකස් කළ යුතු ය.

(ඇ) සංවර්ධනය කරනු ලබන තැනැත්තා විසින් මෙම සැලැස්ම ක්‍රියාත්මක කර පවත්වාගෙන යා යුතු ය.

19. අවසරලත් භාවිතයක් අනුමත කිරීමේ ක්‍රියාවලිය සඳහා සහ අවසරලත් භාවිතයට අදාළ ක්‍රියාකාරකම් පසු විපරම් කිරීම සඳහා පරිපාලන ගාස්තුවක් (අධිකාරිය විසින්) ව්‍යාපෘති යෝජක වෙතින් අයකර ගත යුතු ය.

20. ගම්වැසියන්ගේ සම්ප්‍රදායික ජන ජීවිතයට බාධාවන පරිදි කිසිදු ක්‍රියාකාරකමක් සිදු නොකළ යුතු ය.

21. මෙහි සඳහන් ඕනෑම කොන්දේසියක් කඩකරනු ලබන තැනැත්තෙක් 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ ප්‍රතිපාදන යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කරන්නේ ය.

07-67

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.